# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ඔක්තෝම්බර් - 3 සතිය

## කාර්ය පත්‍රිකාව - බුද්ධ ධර්මය - 3 ශ්‍රේණිය

සැකසුම :- බලන්ගොඩ අධ්‍යාපන කලාපය
ප්‍රදීප් කුමාර කිත්සිරි - ර/දන්දෙනිය විද්‍යාලය



පුංචි දුවේ , පුතේ ,

ඔයාලා පෝයදාට පන්සල් යනවා නේද ? හා.. එහෙනම් ලියන්නකො බලන්න පන්සල් යන කොට රැගෙන යන දේවල් මොනවද කියලා.

...................... ........................ .......................... ......................... ...........................

- ❖ ඔයාලා පන්සලේදී හරි පාසලේදී හරි නිවසේදී හරි සිල් සමාදන් වෙලා තියෙනවා නේද ? සිල් සමාදන් වෙනකොට අපි අටසිල් සමාදන් වෙනවා.ඔයාලට ඒ අටසිල් පද මතකද?
- ❖ ඔයාලගේ බුද්ධ ධර්මය පෙළ පොතේ 24 වෙනි පාඩම "අටසිල් සමාදන් වෙමු" ඒ පාඩම තියෙනවා අටසිල් පද . ඔයාලගේ ගෙදර වැඩිහිටියන්ට කියලා ඒ පාඩමත් එක්ක අටසිල් පද කියවලා බලන්නකෝ.





- ❖ මේ ලස්සන චිත්‍ර දෙක බලන්නකො. ඔන්න ඔයාලටත් පුලුවන් ඔයාලගෙ චිත්‍ර පොතේ හරි වෙනත් කොළයක හරි ලස්සන චිත්‍රයක් ඇඳලා පාට කරන්න. ඔයාලා සිල් සමදන් වූ දවස මතක් කරලා.
- ❖ හැමදාම හවසට මල් කඩලා පහන් පත්තු කරලා බුදුන් වඳින්න ඔයාලත් පුරුදු වෙන්න. දැනටමත් එහෙම කරනවා නම් ඔයාලා ගොඩක් හොඳයි.
- ❖ වැඩිහිටියන්ගෙන් අහලා ඔයාලගේ ගමේ පන්සල ගැන තොරතුරු සඳහන් වෙන පුංචි වැකි තුනක් ලියන්න ඔයාලට පුළුවන් නේද ?
- ❖ මීළඟ පසළොස්වක පෝය දවසේ ගෙදර අයත් එක්ක එකතු වෙලා පන්සලේ හරි නිවසේ හරි අටසිල් සමාදන් වෙන්න ඔන්න පුංචි ඔයාලට පුළුවන්.
- ❖ මේ කාර්ය පත්‍රිකාවේ සඳහන් වෙන ක්‍රියාකාරකම් සියල්ල සම්පූර්ණ කරලා ඉවර නම් ඔන්න පුංචි ඔයාලට පුළුවන් පහලින් තියෙන තරු තුන රතු පැනෙන් පාට කරන්න.



☆ ☆ ☆

